# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2291/33 – 2022 අගෝස්තු මස 04 වැනි බ්‍රහස්පතින්දා – 2022.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 133 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2016/UDA/549.
ප්‍රා. ලේ. යොමු අංකය: KDS/KGK/4/2/2016/03/01.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය,

2022 ජූනි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. –** ප්‍රාදේශීය ලේකම්, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ.

2. **ඉඩමේ විස්තරය. –** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගැටඹේ (220), උඩබෝවල (244) ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, වෙල්අට, බෝවල (මහනුවර මහ නගර සභා සීමාව තුළ) ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/MHN/2019/272 හා 2021.09.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – උඩගඟුල් කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.5130**

උතුරට: මැද ඇළ, සියඹලාන්තේ කුඹුරේ ඇළ සහ මාර්ගය; නැගෙනහිරට: සියඹලාන්තේ කුඹුරේ ඇළ; දකුණට: කැබලි අක්ෂර B සහ හෙට්ටිආරච්චි සහ තවත් අය හිමිකම් කියන පන්සලේ ඉඩම; බටහිරට: කැබලි අක්ෂර C, E, F සහ මැද ඇළ.

02. **කැබලි අක්ෂර 'B' – උඩගඟුල් කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0936**

උතුරට: කැබලි අක්ෂර A; නැගෙනහිරට: සියඹලාන්තේ කුඹුරේ ඇළ; දකුණට: හෙට්ටිආරච්චි සහ තවත් අය හිමිකම් කියන පන්සලේ ඉඩම; බටහිරට: හෙට්ටිආරච්චි සහ තවත් අය හිමිකම් කියන පන්සලේ ඉඩම සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A.

03. **කැබලි අක්ෂර 'C' – පල්මුල්ලේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.5117**

උතුරට: මැද ඇළ සහ කැබලි අක්ෂර D; නැගෙනහිරට: කැබලි අක්ෂර F, E, A සහ හෙට්ටිආරච්චි සහ තවත් අය හිමිකම් කියන පන්සලේ ඉඩම; දකුණට: හෙට්ටිආරච්චි සහ තවත් අය හිමිකම් කියන පන්සලේ ඉඩම, මාර්ගය සහ ශ්‍රී අමරවංශ මාවත; බටහිරට: ශ්‍රී අමරවංශ මාවත සහ දුම්රිය මාර්ගය.

04. **කැබලි අක්ෂර 'D' – වහලවෙල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0242**

උතුරට: මැද ඇළ; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: කැබලි අක්ෂර C.

05. **කැබලි අක්ෂර 'E' – උඩගඟුල් කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0248**

උතුරට: මැද ඇළ සහ කැබලි අක්ෂර F; නැගෙනහිරට: කැබලි අක්ෂර A සහ C; දකුණට: කැබලි අක්ෂර C; බටහිරට: කැබලි අක්ෂර C සහ මැද ඇළ.

06. **කැබලි අක්ෂර 'F' – උඩගඟුල් කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0523**

උතුරට: මැද ඇළ, නාගරික සංවර්ධන අධිකාරිය සහ තවත් අය හිමිකම් කියන වහලවෙල සහ කැබලි අක්ෂර G; නැගෙනහිරට: මැද ඇළ සහ කැබලි අක්ෂර A, E; දකුණට: කැබලි අක්ෂර A, E සහ මැද ඇළ; බටහිරට: මැද ඇළ සහ නාගරික සංවර්ධන අධිකාරිය සහ තවත් අය හිමිකම් කියන වහලවෙල.

07. **කැබලි අක්ෂර 'G' – උඩගඟුල් කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0016**

උතුරට සහ නැගෙනහිරට: නාගරික සංවර්ධන අධිකාරිය සහ තවත් අය හිමිකම් කියන වහලවෙල; දකුණට: මැද ඇළ සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර F; බටහිරට: නාගරික සංවර්ධන අධිකාරිය සහ තවත් අය හිමිකම් කියන වහලවෙල.

08. **කැබලි අක්ෂර 'H' – වහලවෙල – ප්‍රමාණය: හෙක්. 0.1170**

උතුරට සහ නැගෙනහිරට: නාගරික සංවර්ධන අධිකාරිය සහ තවත් අය හිමිකම් කියන වහලවෙල; දකුණට: මැද ඇළ; බටහිරට: කැබලි අක්ෂර J.

09. **කැබලි අක්ෂර 'J' – වහලවෙල, සිරියාගේ කණාටිය හෙවත් තණකොළ කොටුව – ප්‍රමාණය: හෙක්. 0.2551**

උතුරට: කැබලි අක්ෂර L සහ නාගරික සංවර්ධන අධිකාරිය සහ තවත් අය හිමිකම් කියන වහලවෙල; නැගෙනහිරට: කැබලි අක්ෂර H; දකුණට: මැද ඇළ; බටහිරට: කැබලි අක්ෂර K සහ L.

10. **කැබලි අක්ෂර 'K' – වහලවෙල – ප්‍රමාණය: හෙක්. 0.0270**

උතුරට: කැබලි අක්ෂර L; නැගෙනහිරට: කැබලි අක්ෂර J; දකුණට: කැබලි අක්ෂර J සහ මැද ඇළ; බටහිරට: මැද ඇළ සහ කැබලි අක්ෂර L.

11. **කැබලි අක්ෂර 'L' – වහලවෙල – ප්‍රමාණය: හෙක්. 0.1240**

උතුරට: දුම්රිය මාර්ගය සහ විලියම් ගොපල්ලව මාවත; නැගෙනහිරට: නාගරික සංවර්ධන අධිකාරිය සහ තවත් අය හිමිකම් කියන වහලවෙල; දකුණට: කැබලි අක්ෂර J සහ K; බටහිරට: කැබලි අක්ෂර K, මැද ඇළ සහ දුම්රිය මාර්ගය.

EOG 08-0035

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.